# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2002 අංක 27 දරන බද්ධ නිවාස අයිතිකම් (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2002 දෙසැම්බර් මස 04 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2002 දෙසැම්බර් මස 05 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. 4.25 යි.    තැපැල් ගාස්තුව : රු. 4.50 යි.

**2002 අංක 27 දරන බද්ධ නිවාස අයිතිකම්**
**(විශේෂ විධිවිධාන) (සංශෝධන)**

[සහතිකය සටහන් කළේ 2002 දෙසැම්බර් මස 04 වන දින]

එල්. ඩී.— ඕ. 23/2002

**1999 අංක 4 දරන බද්ධ නිවාස අයිතිකම් (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2002 අංක 27 දරන බද්ධ නිවාස අයිතිකම් (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඩු නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1999 අංක 4 දරන බද්ධ නිවාස අයිතිකම් (විශේෂ විධිවිධාන)පනතේ 3 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :- 1999 අංක 4 දරන පනතේ 3 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"ප්‍රධාන ප්‍රඥප්තියේ 1 වන කොටස දීර්ඝ කිරීම. 3. ප්‍රධාන ප්‍රඥප්තියේ 1 වන කොටසේ විධිවිධාන 2003, දෙසැම්බර් 31 වන දින තෙක් ක්‍රියාත්මකව තිබිය යුතු ය. ".

3. මේ පනතේ 2 වන වගන්තිය මගින්, ප්‍රධාන ප්‍රඥප්තියට කරන ලද සංශෝධනය 2001 මාර්තු මස 10 වන දින සිට ක්‍රියාත්මක වූ ලෙස සියලු කාර්යයන් සඳහා සලකනු ලැබිය යුතු ය. අතීතයට බලපෑම.

4. (1) ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 11 දරන බද්ධ නිවාස අයිතිකම් පනතේ 6 වන වගන්තියට අනුකූලව රෙජිස්ට්‍රාර්වරයෙක් විසින් ලියාපදිංචි කරනු ලැබිය යුතු යයි නියම කරනු ලැබ ඇත්තා වූ ද, 2001 මාර්තු මස 10 වන දින හෝ ඊට පසු දිනයක දී ආරම්භව සහ මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව වූ දිනයෙන් අවසන් වන කාලසීමාව තුළ දී එසේ ලියාපදිංචි කරනු ලැබුවා වූ ද, ජාතික නිවාස කොමසාරිස්වරයාට හෝ ජාතික නිවාස සංවර්ධන අධිකාරියට අයත්වන්නා වූ ද යම් සහාධිපත්‍ය දේපළකට අදාළ සහාධිපත්‍ය පිඹුරක් ඉහත කී වගන්තියේ නියමයන්ට අනුකූලව වලංගු ආකාරයට ලියාපදිංචි කරනු ලැබ ඇති බවට සලකනු ලැබිය යුතු ය. වලංගුභාවය ලබාදීම.

(2) 2001 මාර්තු මස 10 වන දින හෝ ඊට පසු දිනක දී ආරම්භව සහ මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව වූ දිනයෙන් අවසන් වන කාලසීමාව තුළ දී, ජාතික නිවාස කොමසාරිස්වරයාගේ හෝ ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සාමාන්‍යාධිකාරිවරයාගේ අත්සන යටතේ නිකුත් කරනු ලැබුවා වූ ද ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තියේ (2) වන උපවගන්තියෙන් විස්තර කරනු ලැබුවා වූ ද සහතිකයක්, එකී වගන්තියේ නියමයන්ට අනුකූලව වලංගු ආකාරයට නිකුත් කරනු ලැබ ඇති බවට සලකනු ලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

5. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.